# ශ්‍රී ලංකාවේ නාගරික උප සාඵල්‍යතාව කෙරෙහි බලපාන සමාජ ආර්ථීක සාධක පිළිබඳ අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

චාමිකා ප්‍රියදර්ශනී රන්හොටී [1]
සුජානි රත්නසේකර[2]

සංක්ෂේපය

මානව සාඵල්‍යතාව යනු ස්ත්‍රියක් සිය ප්‍රජනන කාලසීමාව තුළ බිහිකර ඇති සජීවී දරුවන් සංඛ්‍යාවයි. මෙය කාලික සමාජ ආර්ථීක හේතු මත විවිධ වෙනස්වීම් වලට ලක්වන ජනසංඛ්‍යාවේ ගතික සංරචකයකි. උපසාඵල්‍යතාව සාඵල්‍යතා වෙනස්කම් හඳුනාගැනීම සඳහා භාවිතා කළහැකි ප්‍රධාන සංකල්පයකි. යුවළකට දරුවන් ලැබීමේ ප්‍රවනතාවය අඩුමට්ටමක පැවතීම උපසාඵල්‍යතාව යනුවෙන් හැඳින්වේ. ස්වෙච්ඡාමය හේතු මත හෝ සෞඛ්‍යමය හේතු මත උපසාඵල්‍යතා තත්ත්වයන් උද්ගත වේ. මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, නාගරික උප සාඵල්‍යතාව කෙරෙහි බලපාන සමාජ ආර්ථීක සාධක හඳුනා ගැනීමයි. කුරුණෑගල මහ නගර සභා බලප්‍රදේශයේ දරුවන් නොමැති සහ එක් දරුවකු සිටින් කාන්තාවන්ගෙන් සරල සසම්භාවී ක්‍රමය යටතේ කාන්තාවන් 50 තෝරාගත් අතර ප්‍රජාවිද්‍යා අධ්‍යයන ප්‍රවේශය යටතේ ප්‍රාථමික දත්ත ලබාගැනීමේ ශිල්පක්‍රම වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රම භාවිතාකරන ලදී. පර්යේෂණයට අනුව නාගරික සමාජ දරුවන්ගෙන් නැවත බලාපොරොත්තු වන සමාජ සහ ආර්ථීක අපේක්ෂණ අවම වී ඇති බවත් ඒ නිසා දරුවන් වැඩි ප්‍රමාණයක් පවුලකට අවශ්‍ය නොවන බවත් යන විශ්වාසයේ පසුවන බව හඳුනාගතහැකි විය. එසේම රැකියාවන්හි අවිවේකී භාවය, විදේශ ගත වීම්, උසස් අධ්‍යාපනයට යොමුවීම ආදී තත්ත්වයන් නිසා දිගු කාලයක් දරුවන් අපේක්ෂාවෙන් නොසිට වසර තිස් පහෙන් පසු දරුවන් අපේක්ෂා කිරීම නිසා ස්වේච්ඡා නොවන සාධක මත ඇතිවන උපසාඵල්‍යතා තත්ත්වයන් වර්ධනයක් නාගරික ප්‍රදේශවලින් හඳුනාගත හැකි වේ.

[1] චාමිකා ප්‍රියදර්ශනී රන්හොටී, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය chamika.priyadarshi@gmail.com
[2] කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය rathnasekara@kln.ac.lk